ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2017 දෙසැම්බර් මස 29 වැනි දින** |

## 2017 ඔක්තෝබර් මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

**සමස්ත නිරීක්ෂණ**

වෙළඳ හිඟයෙහි සැලකිය යුතු අඩු වීම සහ ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම වෙත වූ අඛණ්ඩ ලැබීම් හේතුවෙන් 2017 වසරේ ඔක්තෝබර් මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. අපනයන ආදායම අඛණ්ඩව සිව් වැනි මාසයට ද ඉලක්කම් දෙකක අගයකින් වර්ධනය වී ඉහළ මට්ටමක පැවතීම සහ ආනයන වියදම අඩු වීම, 2017 වසරේ ඔක්තෝබර් මාසයේ දී වෙළඳ හිඟය වාර්ෂික පදනම මත සැලකිය යුතු ලෙස අඩු වීම සඳහා හේතු විය. කෙසේ වුව ද, සංචාරක ඉපැයීම් මධ්‍යස්ථ ලෙස වර්ධනය වූ අතර, මැදපෙරදිග කලාපයේ පවතින අහිතකර ආර්ථික හා භූ-දේශපාලනික තත්ත්වයන් හේතුවෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ තවදුරටත් අඩු විය. ඔක්තෝබර් මාසය තුළ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශ ආයෝජන සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ විදේශ ආයෝජන ඉහළ යෑම මධ්‍යයේ ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් අඛණ්ඩව පැවතුණි. මෙම වර්ධනයන් පෙන්නුම් කරමින්, 2017 වසරේ ඔක්තෝබර් මාසය අවසාන වන විට ගෙවුම් තුලනයෙහි සමස්ත ශේෂය එ.ජ. ඩොලර් බිලියන 2.0 ක අතිරික්තයක් වාර්තා කළේය. මේ අතර, 2017 වසරේ ඔක්තෝබර් මාසය අවසානයේ දී දළ නිල සංචිත මට්ටම එ.ජ. ඩොලර් බිලියන 7.5 ක් දක්වා වර්ධනය වූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් විදේශ විනිමය මිලදී ගැනීම මේ සඳහා විශේෂයෙන් හේතු විය.

## සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2016 ඔක්තෝබර් (එ.ජ.ඩො. මිලියන) | 2017 ඔක්තෝබර් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2016 ජන. - ඔක්. (එ.ජ.ඩො. මිලියන) | 2017 ජන. - ඔක්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 855 | 976 | 14.1 | 8,641 (ආ) | 9,400 | 8.8 |
| ආනයන | 1,724 (ආ) | 1,727 | 0.2 | 15,635 (ආ) | 16,991 | 8.7 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -868 (ආ) | -752 | - | -6,994 (ආ) | -7,591 | - |
| සංචාරක ඉපැයීම් | 258 | 262 (ඇ) | 1.3 | 2,846 | 2,924 (ඇ) | 2.7 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 608 | 533 | -12.2 | 5,990 | 5,518 | -7.9 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඈ) | 8 | 13 | 55.0 | -11 | 279 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් | 129 (ආ) | 319 | 148.2 | 4,411 (ආ) | 5,046 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 43 | 142 | 229.4 | 1,204 | 1,403 | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | - | 1,500 | 1,500 | |
| දිගුකාලීන ණය | 86 (ආ) | 177 | 107.4 | 1,007 (ආ) | 1,143 | |
| විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම | - | - | - | 700 | 1,000 | |
| ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම | - | - | - | 168 | 167 | |
| විදේශීය සෘජු ආයෝජන (ඉ) | - | - | - | 397 | 766 | |
| සමස්ත ශේෂය | - | - | - | -274 | 1,991 | |


මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2017 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැක.
(ඈ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.
(ඉ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස නවය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ.

## වෙළඳ ශේෂය

2017 ඔක්තෝබර් මාසයේ දී වෙළඳ ගිණුමේ හිඟය පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අඩු වූ අතර අපනයන ආදායම හිතකර ලෙස වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුව ද, 2017 වසරේ පළමු මාස දහය තුළ සමුච්චිත වෙළඳ හිඟය මධ්‍යස්ථ වශයෙන් පුළුල් විය.

රූප සටහන 1: මාසික වෙළඳ ශේෂය





මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### අපනයන ක්‍රියාකාරිත්වය

අපනයන ආදායම වර්ධනය වීමේ ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින් 2017 ඔක්තෝබර් මාසයේ දී අපනයන ආදායම ඉලක්කම් දෙකක වර්ධනයක් වාර්තා කරමින් තවදුරටත් ඉහළ ගියේය. ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා වෙළඳපොළ වෙත සිදු කරන ලද ඇඟලුම් අපනයන ඉහළ යෑම පිළිබිඹු කරමින් කාර්මික අපනයන ආදායම ඉහළ යෑම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ඇඟලුම් අපනයන සඳහා ඉල්ලුම ඉහළ යෑම පිළිබිඹු කරමින් 2017 ඔක්තෝබර් මාසයේ දී ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ ඇඟලුම් අපනයන සියයට 14.7 කින් ඉහළ ගිය අතර, විශේෂ ප්‍රතිලාභ සහිත වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී. ප්ලස්) පහසුකමෙහි ප්‍රතිලාභ පෙන්නුම් කරමින් යුරෝපා වෙළඳපොළ වෙත සිදු කළ ඇඟලුම් අපනයන සියයට 8.0 කින් ඉහළ ගියේය. එළවළු, පලතුරු හා ඇට වර්ග ආශ්‍රිත සැකසුම් අපනයනවල වාර්තා වූ යහපත් ක්‍රියාකාරිත්වය හේතුවෙන් ආහාර, පානවර්ග සහ දුම්කොළ අපනයන ආදායම මෙම මාසය තුළ දී ඉහළ ගියේය. තවද, ප්‍රධාන වශයෙන්ම රබර් ටයර් අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන් රබර් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ ගියේය. නැව් සහ ගුවන්යානා සඳහා භාවිත කරනු ලබන ඉන්ධනවල අපනයන පරිමා සහ අපනයන මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම ද කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. මේ අතර, 2017 ඔක්තෝබර් මාසයේ දී ද කෘෂිකාර්මික අපනයන ආදායම අඛණ්ඩව ඉහළ ගියේය. තේ සඳහා සාමාන්‍ය අපනයන මිල ගණන් සියයට 13.3 කින් ඉහළ යෑමත්, තේ අපනයන පරිමාව සියයට 11.3 කින් ඉහළ යෑමත් හේතුවෙන් තේ අපනයන ආදායමෙහි සිදු වූ කැපී පෙනෙන වර්ධනය කෘෂිකාර්මික අපනයන ආදායම ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. කුරුඳු අපනයන පරිමාව සහ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් කුළුබඩු අපනයන ආදායම ඉහළ ගියේය. යුරෝපා වෙළඳපොළ වෙත මුහුදු ආහාර අපනයනය කිරීම සඳහා පනවා තිබූ තහනම ඉවත් කිරීම සහ ජී.එස්.පී. ප්ලස් සහනය නැවත ලැබීමේ යහපත් බලපෑම පිළිබිඹු කරමින් 2017 ඔක්තෝබර් මාසයේ දී යුරෝපා වෙළඳපොළ වෙත සිදු කරන ලද මුහුදු ආහාර අපනයන පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 145 කින් වර්ධනය වීමත් සමඟ මුහුදු ආහාර අපනයන ආදායම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වුව ද, ප්‍රධාන වශයෙන්

**රූප සටහන 2 : මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

සියලුම පොල් මද ආශ්‍රිත නිෂ්පාදිතවල දේශීය සැපයුම පහළ යෑම හේතුවෙන් 2017 ඔක්තෝබර් මාසයේ පොල් අපනයන ආදායම 2016 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව පහළ ගියේය. 2017 ඔක්තෝබර් මාසයේ දී ශ්‍රී ලංකාවේ භාණ්ඩ අපනයනය සඳහා ප්‍රධාන වෙළඳපොළ ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ඉතාලිය සහ ජර්මනිය පැවති අතර එම රටවල් වෙත සිදු කරන ලද අපනයන, මුළු අපනයන ආදායමෙන් සියයට 51 ක් පමණ විය.

**සංඛ්‍යා සටහන 2: අපනයන ආදායම (අ)**

| කාණ්ඩය | 2016 ඔක්. (එ.ජ.ඩො. මිලියන) | 2017 ඔක්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2016 ජන - ඔක්. (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2017 ජන - ඔක් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **654.0** | **725.0** | **10.9** | **6,661.4** | **7,031.8** | **5.6** |
| රෙදිපිළි හා ඇඟලුම් | 391.6 | 422.6 | 7.9 | 4,107.5 | 4,137.6 | 0.7 |
| එයින්, ඇඟලුම් | 363.5 | 399.7 | 10.0 | 3,877.3 | 3,895.2 | 0.5 |
| රබර් නිෂ්පාදිත | 68.3 | 78.8 | 15.4 | 644.3 | 693.5 | 7.6 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 23.7 | 35.1 | 48.2 | 276.8 | 331.4 | 19.7 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 36.3 | 35.1 | (3.5) | 265.7 | 312.5 | 17.6 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 27.2 | 34.9 | 28.4 | 231.6 | 327.8 | 41.5 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 25.7 | 25.8 | 0.5 | 236.2 | 214.0 | (9.4) |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 10.7 | 11.0 | 2.4 | 140.6 | 131.4 | (6.6) |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 8.9 | 8.5 | (3.9) | 76.2 | 93.9 | 23.3 |
| ප්‍රවාහන උපකරණ | 5.2 | 6.3 | 21.0 | 117.2 | 151.0 | 28.9 |
| සත්ත්ව ආහාර | 6.5 | 5.8 | (10.3) | 54.5 | 62.2 | 14.2 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 0.6 | 3.7 | 573.5 | 18.6 | 37.9 | 103.5 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 3.1 | 3.0 | (4.5) | 29.5 | 28.1 | (4.5) |
| වෙනත් | 46.1 | 54.4 | 17.9 | 462.7 | 510.5 | 10.3 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **197.8** | **245.6** | **24.2** | **1,942.3** | **2,323.4** | **19.6** |
| තේ | 108.1 | 136.2 | 26.1 | 1,057.9 | 1,275.9 | 20.6 |
| කුළුබඩු | 28.7 | 42.4 | 47.9 | 262.7 | 339.9 | 29.4 |
| පොල් | 33.0 | 30.1 | (8.7) | 308.5 | 303.3 | (1.7) |
| මුහුදු ආහාර | 13.3 | 20.2 | 51.5 | 136.3 | 196.3 | 44.0 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 7.9 | 9.4 | 19.9 | 101.8 | 120.4 | 18.2 |
| සකස් නොකළ දුම්කොළ | 1.9 | 2.9 | 52.2 | 26.2 | 29.6 | 13.0 |
| එළවළු | 1.9 | 2.5 | 33.4 | 22.7 | 24.6 | 8.6 |
| රබර් | 3.0 | 1.8 | (41.3) | 26.2 | 33.4 | 27.5 |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **3.3** | **4.9** | **48.0** | **37.3** | **44.5** | **19.4** |
| **මුළු අපනයන** | **855.0** | **975.6** | **14.1** | **8,641.1** | **9,399.7** | **8.8** |


මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

## ආනයන ක්‍රියාකාරිත්වය

2017 ඔක්තෝබර් මාසයේ ආනයන වියදම මන්දගාමී වූ අතර සීනි ආනයන මිල ගණන් සහ පරිමාවන් පහළ යෑම හේතුවෙන් සීනි ආනයන වියදම පහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. 2016 ඔක්තෝබර් මාසයේ වාර්තා කළ ඉහළ ආනයන වියදම ද එම මාසයට සාපේක්ෂව 2017 ඔක්තෝබර් මාසයේ සීනි ආනයන වියදම පහළ යෑමට හේතු විය. බොර තෙල් ආනයන මිල ගණන් ඉහළ ගිය ද ආනයන පරිමාව අඩු වීම හේතුවෙන් ඉන්ධන ආනයනය පහළ ගියේය.

රූප සටහන 3 : මාසික ආනයන ක්‍රියාකාරිත්වය




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

විදුලි සංදේශ උපකරණ මූලික කරගත් යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයනය සහ ප්‍රවාහන උපකරණ ආනයනය පහළ යෑම හේතුවෙන් ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය. ත්‍රිරෝද රථ හා ලොරි රථ ආනයන ද පහත වැටුණි. සිමෙන්ති මූලික කරගත් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයනය පහළ යෑමත්, නිම කරන ලද හා අමුද්‍රව්‍ය ලෙස ඇති යකඩ හා වානේ ආනයන සහ සිමෙන්ති ක්ලින්කර ආනයනය ඉහළ යෑමත් හේතුවෙන් 2017 ඔක්තෝබර් මාසයේ දී ගොඩනැගිලි කර්මාන්තය ආශ්‍රිත ආනයනවල මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කළේය. කෙසේ වුව ද, දේශීය වෙළඳපොළ තුළ පවතින සහල් හිඟය සපුරාලීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග හේතුවෙන් 2017 ජනවාරි සිට පෙන්නුම් කළ සහල් ආනයනය ඉහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින් 2017 ඔක්තෝබර් මාසයේ සහල් ආනයන පරිමාව පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 2,433.6 කින් ඉහළ ගියේය. රෙදිපිළි හා උපාංග ආනයනය ද ඉහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම රෙදිපිළි හා පාවහන් ආනයනය ඉහළ යෑම දායක විය. 2017 ඔක්තෝබර් මාසය තුළ ඉන්දියාව, චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සිංගප්පූරුව සහ ජපානය, ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන ප්‍රභව ලෙස පැවති අතර එම රටවල් වෙතින් සිදු කළ ආනයන මුළු ආනයනවලින් සියයට 59 ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 3: ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2016 ඔක්. (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2017 ඔක්. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2016 ජන - ඔක්. (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2017 ජන - ඔක් (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **377.2** | **382.2** | **1.3** | **3,576.8** | **3,661.2** | **2.4** |
| ආහාර හා පාන වර්ග | 159.8 | 148.9 | (6.8) | 1,343.7 | 1,484.6 | 10.5 |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 2.4 | 37.8 | 1,465.9 | 17.8 | 245.9 | 1,278.3 |
| එයින්, සහල් | 1.6 | 36.5 | 2,164.3 | 10.2 | 234.9 | 2,202.1 |
| එළවළු | 22.3 | 24.4 | 9.5 | 302.6 | 288.0 | (4.8) |
| කිරි නිෂ්පාදිත | 20.9 | 23.9 | 14.6 | 196.5 | 250.3 | 27.4 |
| සීනි හා රසකැවිලි | 57.3 | 14.2 | (75.1) | 291.9 | 213.7 | (26.8) |
| කුළුබඩු | 11.9 | 7.7 | (35.3) | 114.1 | 78.0 | (31.7) |
| පාන වර්ග | 9.9 | 6.6 | (33.0) | 82.4 | 67.1 | (18.6) |
| තෙල් සහ මේදය | 2.8 | 3.1 | 10.3 | 30.5 | 37.5 | 23.0 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 32.3 | 31.1 | (3.7) | 307.9 | 304.2 | (1.2) |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 217.4 | 233.3 | 7.3 | 2,233.1 | 2,176.6 | (2.5) |
| රථවාහන | 64.6 | 54.8 | (15.2) | 672.5 | 615.2 | (8.5) |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 43.5 | 48.7 | 12.1 | 437.0 | 423.3 | (3.1) |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 22.5 | 34.6 | 53.9 | 310.1 | 319.1 | 2.9 |
| ආලේප වර්ග හා සේදුම් ද්‍රව්‍ය | 7.3 | 5.5 | (25.0) | 73.4 | 65.5 | (10.8) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 79.4 | 89.6 | 12.8 | 740.1 | 753.5 | 1.8 |
| **2. අන්තර් භාණ්ඩ** | **899.0** | **948.4** | **5.5** | **7,983.6** | **9,169.6** | **14.9** |
| ඉන්ධන | 253.7 | 236.9 | (6.6) | 1,930.9 | 2,688.2 | 39.2 |
| එයින් බොරතෙල් | 75.0 | 41.6 | (44.5) | 479.4 | 512.6 | 6.9 |
| පිරිපහදු කළ ඛනිජතෙල් | 164.2 | 176.1 | 7.3 | 1,327.2 | 1,982.2 | 49.4 |
| ගල්අඟුරු | 14.6 | 19.2 | 31.5 | 124.3 | 193.4 | 55.6 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 68.7 | 79.5 | 15.7 | 412.4 | 594.3 | 44.1 |
| එයින්, රත්‍රන් | 56.6 | 63.3 | 11.8 | 300.9 | 498.0 | 65.5 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 232.4 | 242.1 | 4.2 | 2,218.7 | 2,240.6 | 1.0 |
| රසායනික නිෂ්පාදිත | 74.4 | 76.7 | 3.1 | 702.6 | 690.0 | (1.8) |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත උපාංග | 55.0 | 58.4 | 6.3 | 508.1 | 516.1 | 1.6 |
| කඩදාසි, ඝන කඩදාසි හා ඒ ආශ්‍රිත උපාංග | 36.2 | 46.1 | 27.2 | 399.8 | 399.7 | (0.0) |
| මූල ලෝහ | 37.0 | 43.4 | 17.3 | 326.8 | 462.6 | 41.5 |
| තිරිඟු හා ඉරිඟු | 19.2 | 31.1 | 62.4 | 221.7 | 295.7 | 33.4 |
| රබර් හා ඒ ආශ්‍රිත උපාංග | 30.0 | 24.3 | (19.1) | 241.6 | 240.6 | (0.4) |
| ආහාර සැකසුම් | 21.6 | 22.8 | 5.4 | 190.9 | 245.8 | 28.7 |
| පොහොර | 5.4 | 10.6 | 95.7 | 111.7 | 81.8 | (26.8) |
| වෙනත් | 65.3 | 76.4 | 17.1 | 718.3 | 714.3 | (0.6) |
| **3. ආයෝජන භාණ්ඩ** | **446.0** | **392.5** | **(12.0)** | **4,063.1** | **4,016.2** | **(1.2)** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 235.6 | 205.6 | (12.7) | 2,245.7 | 2,147.4 | (4.4) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 134.1 | 125.2 | (6.7) | 1,271.1 | 1,302.9 | 2.5 |
| ප්‍රවාහන උපකරණ | 75.9 | 61.2 | (19.4) | 541.3 | 559.0 | 3.3 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.5 | 0.5 | 16.0 | 5.0 | 6.8 | 36.8 |
| **4. වර්ග නොකළ ආනයන** | **1.3** | **4.1** | **202.5** | **11.1** | **143.9** | **1,193.6** |
| **මුළු ආනයන** | **1,723.5** | **1,727.2** | **0.2** | **15,634.7** | **16,990.9** | **8.7** |


මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික
(ආ) සංශෝධිත

### ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්


2017 ඔක්තෝබර් මාසයේ දී සංචාරක පැමිණීම් 2016 ඔක්තෝබර් මාසයට සාපේක්ෂව සුළු වැඩිවීමක් වාර්තා කළ අතර, මාසය තුළ සංචාරක ඉපැයීම් ද සුළු වශයෙන් වර්ධනය විය. ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය සහ ප්‍රංශය යන රටවල් 2017 වසරේ ඔක්තෝබර් මාසය දක්වා වූ මාස දහය තුළ දී සංචාරකයින් පැමිණි ප්‍රධාන මූලාශ්‍ර වූ අතර, එම රටවලින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව මෙම කාලපරිච්ඡේදයේ දී පැමිණි මුළු සංචාරකයින්ගෙන් සියයට 52.4 ක් විය. වසරේ පළමු මාස දහය තුළ දී පැමිණි මුළු සංචාරකයින් සංඛ්‍යාව සහ මුළු සංචාරක ඉපැයීම් 2016 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී ඉහළ ගියේය. මේ අතර, මැදපෙරදිග කලාපයේ පවතින අහිතකර ආර්ථික හා භූ-දේශපාලනික තත්ත්වයන් හේතුවෙන් 2017 වසරේ ඔක්තෝබර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ තවදුරටත් සියයට 12.2 කින් සැලකිය යුතු ලෙස අඩු විය. ඒ අනුව, 2017 වසරේ ඔක්තෝබර් මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණවල සමුච්චිත ලැබීම් වාර්ෂික පදනම මත සියයට 7.9 කින් අඩු විය.

**රූප සටහන 4 : සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර පහ**




මූලය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 5 : සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන් : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, වාණිජ බැංකු, ශ්‍රී ලංකා මහ බැංකුව

### මූල්‍ය ලැබීම්


2017 වසරේ ඔක්තෝබර් මාසයේ දී ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම තවදුරටත් ශක්තිමත් විය. ආයෝජකයන්ගේ ධනාත්මක ආකල්ප පිළිබිඹු කරමින් කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශ ආයෝජන (ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ විදේශ විනිමය ප්‍රවාහ ඇතුළුව) 2017 වසරේ ඔක්තෝබර් මාසයේ දී සහ 2017 වසරේ පළමු මාස දහය තුළ දී සැලකිය යුතු ශුද්ධ ලැබීම් වාර්තා කළ අතර, 2016 වසරේ පළමු මාස දහය තුළ දී කොළඹ

කොටස් වෙළඳපොළ වෙතින් වාර්තා වූයේ ශුද්ධ පදනම මත ආයෝජන ඉවත් කර ගැනීමකි. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන අඛණ්ඩව අට වැනි මාසයට ද ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. මේ අතර, රජය වෙත ලැබුණු ශුද්ධ දිගුකාලීන ණය ප්‍රමාණය ද වසරේ පළමු මාස දහය තුළ දී ඉහළ ගියේය.

## ජාත්‍යන්තර සංචිත

2017 වසරේ ඔක්තෝබර් මාසය අවසාන වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය 2016 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 6.0 සිට එ.ජ. ඩොලර් බිලියන 7.5 දක්වා වර්ධනය වූ අතර එය ආනයනික මාස 4.4 ක් මූල්‍යනය සඳහා ප්‍රමාණවත් විය. මාසය අවසානයේ දළ නිල සංචිත මට්ටම ඉහළ යාම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් විදේශ විනිමය මිලදී ගැනීම සහ මාසය තුළ දී ආසියානු නිෂ්කාශන සංගමය වෙත වූ ලැබීමය. මේ අතර, බැංකු අංශයේ විදේශ වත්කම් ද ඇතුළත් මුළු විදේශීය වත්කම් ප්‍රමාණය ආනයනික මාස 5.7 කට ප්‍රමාණවත් වන පරිදි එ.ජ. ඩොලර් බිලියන 9.8 ක් විය.

**රූප සටහන 6 : දළ නිල සංචිත සහ සමස්ත ශේෂය**





මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

ශ්‍රී ලංකා රුපියල, 2016 වසරේ දී වාර්තා වූ සියයට 3.8 ක අවප්‍රමාණය වීමට සාපේක්ෂව 2017 දෙසැම්බර් 28 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 1.9 කින් සුළු වශයෙන් අවප්‍රමාණය විය. තවද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල වෙනත් ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ද අවප්‍රමාණය විය.

**රූප සටහන 7 : එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4 : අනෙකුත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2017 දෙසැම්බර් මස 28 දක්වා අධිප්‍රමාණය (+) / අවප්‍රමාණය (-) |
|---|---|
| එ.ජ. ඩොලර් | -1.9% |
| යූරෝ | -13.1% |
| ස්ටර්ලින් පවුම් | -10.1% |
| ජපන් යෙන් | -4.6% |
| කැනේඩියානු ඩොලරය | -8.0% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -8.7% |
| ඉන්දියානු රුපියල | -7.4% |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව